www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මාධ්‍යවලට එරෙහිව තවත් ඉහල පෙලේ තර්ජන

## More high-level threats against the Sri Lankan media

**සරත් කුමාර විසිනි**
**2008 ජූලි 2**

ජූනි 15 වන දා *සන්ඩේ ටයිම්ස්* පුවත්පත සමග කල සම්මුඛ සාකච්ඡාවක දී, ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ කොලඹ මාධ්‍යවලට එරෙහිව අනතුරු ඇඟවීමකට සමාන නව තර්ජනයක් නිකුත් කලේ ය. බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව යලි ඇරඹූ යුද්ධය හා බැඳී ගත් ගැටලු පිලිබඳව ආන්ඩුවත් මිලිටරියත් විවේචනයට ලක් කරමින් ලිපි පල කොට "ත්‍රස්තවාදයට" උදව් දෙන්නේ යැයි කියමින් ඔහු පුවත්පත්වලට තදින් පහර ගැසී ය.

රාජපක්ෂ ශ්‍රී ලාංකික පුවත්පතට සිය අදහස් පල කලේ සුලු පරිමාන පොදු රාජ්‍ය මන්ඩලීය සමුලුවක් සඳහා ලන්ඩනයට ගොස් සිටිය දී ය. මාධ්‍යය, "එල්ටීටීඊයට ප්‍රයෝජනවත් වෙන්න ඉඩ තියෙන, ඒ අනුව ගත්ත ම [එල්ටීටීඊය] මිලිටරිමය වශයෙන් දුර්වල කරන්න ආන්ඩුව ගන්න උත්සාහයන්ට හානිදායක වෙන්න ඉඩ තියෙන තොරතුරු සහ කරුනු පල කරන එක" නො කල යුතු යැයි ඔහු ඉල්ලා සිටියේ ය. "මිලිටරියට තියෙන ශක්තීන් සහ දුර්වලතාවන් ගැන අංග සම්පූර්න චිත්‍රයක් සකස් කර ගැනීම" සඳහාත් එහි "ක්‍රියාවන් පූර්වාපේක්ෂා කිරීම" සඳහාත් එල්ටීටීඊ විශ්ලේෂකයන් මාධ්‍යවල පල වූ තොරතුරු යොදා ගන්නා බව ඔහු කියා සිටියේ ය.

රාජපක්ෂගේ චෝදනා පැහැදිලිව ම හාස්‍යජනක ය. ආන්ඩුව මිලිටරි යුද පෙරමුනුවල පවතින තත්ත්වය පිලිබඳ කිසිදු මාධ්‍ය ආවරනයකට අවසර නොදෙන අතර, හමුදා කඳවුරුවලට සංචාරය කරන හෝ මිලිටරිය සමග කතාබහ කරන මොන යම් මාධ්‍යවේදියෙකු ගැන වුව ද දැඩි සෝදිසියකින් පසු වෙයි. අප්‍රේල් මාසයේ මුහාමලෙයිහි දී සිදු වූ මැත ම මිලිටරිමය පසුබැසීමෙන් අනතුරුව, මාධ්‍යවේදීන් තුවාල ලැබූ සොල්දාදුවන් සමග කතාබහ කිරීම වැලැක්වීමට කොලඹ රෝහල්වල සොල්දාදුවන් හා පොලීසිය යෙදීම පවා සිදු විය.

එපමනක් නො ව, කොලඹ මාධ්‍ය බොහෝ දුරට ම රාජපක්ෂගේ නව යුද්ධයට සිය පූර්න සහාය පල කර ඇත. සිදු වෙමින් පවතින භාතෘ ඝාතක යුද්ධය යුක්ති සහගත කරනු වස් "කොටි ත්‍රස්තවාදීන්ට" එරෙහිව වාර්ගික වෛරය ඇවිලවීමේ දී බොහෝ මාධ්‍ය ක්‍රියාකාරී ප්‍රචාරකයන් ලෙස ක්‍රියා කරයි. මාධ්‍යවේදීන් අතලොස්සක් ආන්ඩුවේ තර්ජනවලට සහ භය ගැන්වීම්වලට කීකරු නො වී, යුද්ධය නො ව, එය කර ගෙන යන ආකාරය ද ඉහල පෙලේ දූෂන සිද්ධීන් ද විවේචනය කර තිබේ. ඔවුන්ගේ ලිපිවලින් පිලිබිඹු වන්නේ, යලි ඇරඹූ යුද්ධය අතීතයේ දී සිදු වී ඇති ආකාරයට ම විනාශයකින් කෙලවර වේ යැයි දේශපාලන සංස්ථාපිතයේ කොටසක් තුල පවත්නා භීතිය යි.

යුද්ධය පිලිබඳව කෙරෙන මොන යම් හෝ විවේචනයක් වුව, සීමිත විවේචනයක් පවා මැඩ ලීම සඳහා රාජපක්ෂ ආන්ඩුවට ඇති අධිෂ්ඨානයෙන් පිලිබිඹු වන්නේ, එහි ම දේශපාලන තත්වයෙහි පවතින අස්ථාවරත්වයත් යුද්ධය දිග් ගැසෙන තත්ත්වය තුල පලල් මහජනතාව අතර පමනක් නො ව මිලිටරිය තුල මත් වැඩෙන අතෘප්තිකර භාවය ගැන ඊට පවතින උත්සුකතාවනුත් ය.

රාජපක්ෂගේ අදහස් දැක්වීම, ආරක්ෂක අමාත්‍යාංශය මෑත දී නිකුත් කල ප්‍රකාශයක් ප්‍රතිරාව නැංවීමක් විය. අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයා ජනාධිපතිගේ සොහොයුරා වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ යි. ජූනි 4 වන දා නිකුත් කෙරුනු එම ප්‍රකාශය, මාධ්‍ය ආවරනය සම්බන්ධයෙන් ගත් විට ආරක්ෂක අමාත්‍යාංශය වඩාත් ම උත්සුක වන ක්ෂේත්‍ර හතරක් ඉස්මතු කර දැක්වී ය. එනම්,

"මිලිටරි මෙහෙයුම්, උසස් වීම් පටිපාටි, මිලදී ගැනීම් විවේචනය කිරීම, ආරක්ෂක තොරතුරු ලබා ගැනීම සඳහා ආචාර ධර්ම විරෝධී ක්‍රියා පිලිවෙත් යොදා ගැනීම" යි.

ඉරාකයෙහි හා ඇෆ්ඝනිස්ථානයෙහි මිලිටරි වාඩි ලා ගැනීම, ඉරානයට කරන තර්ජන සහ රට තුල ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කරන ප්‍රහාර සිය " ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ලෙස යුක්ති සහගත කරන බුෂ් පාලනාධිකාරයේ ප්‍රචාරක ව්‍යාපාරයෙන් රාජපක්ෂ ආන්ඩුව කොපි කර ඇත. රට යුද්ධයක යෙදී සිටින නිසාත් මිලිටරිය "ත්‍රස්තවාදයේ ග්‍රහනයෙන් මහජනතාව මුදා ගනිමින්" සිටින නිසාත් තම ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම අවශ්‍ය වනු ඇතැයි ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශය ද ඔවුන් සේ ම කියා සිටියි.

සැබවින් ම, 2002 සටන් විරාමය එලිපිට ම උල්ලංඝනය කරමින් මාවිල්ආරුහි එල්ටීටීඊ පාලනය යටතේ පැවති ප්‍රදේශ අල්ලා ගැනීම සඳහා 2006 ජුලි මාසයේ දී ආක්‍රමනයක් දියත් කරමින් යලි ඇරඹූ යුද්ධය පොලඹා ලූයේ රාජපක්ෂ ආන්ඩුව යි. 2007 මැද වන විට නැගෙනහිර පිහිටි සියලු එල්ටීටීඊ බල කඳවුරු අල්ලා ගත් මිලිටරිය, අනතුරුව උතුරු ප්‍රදේශ වෙත හැරුනි. පසු ගිය ජනවාරියේ දී, සිය ව්‍යාජ මවා පෑම් අත් හල ආන්ඩුව විවෘතව ම සටන් විරාම ගිවිසුම ඉරා දැමී ය.

කෙසේ වුව ද, යුද්ධය සැලසුම් කල පරිදි සිදු වී නැත. වසර අවසන් වන විට මිලිටරිය ඉතිරිව පවතින එල්ටීටීඊ බල කඳවුරු අල්ලා ගනු ඇති බවට කරන ලද සර්ව ශුභවාදී පුරෝකථනයන් නිකම්ම අත් හැර දමනු ලැබ තිබේ. ඉහල ආරක්ෂක වියදම් ද නිසා පිම්මේ ඉහල යන උද්ධමනය, වැඩ කරන ජනයා අතර පුලුල්ව පැතිර ගිය අතෘප්තිකර භාවයක් ජනනය කරමින් තිබේ. යුද පෙරමුනුවල සිට එක දිගට ගලා එන මල සිරුරු ප්‍රවාහය මගින් තත්වය තවත් සංකීර්න කරනු ලැබ ඇත. ආරක්ෂක උපකරන මිලදී ගැනීම්වල දී සිදු වූ දූෂන, උසස් වීම් ලබා දීමේ දී දැක්වූ අනිසි පක්ෂපාතීකම් සහ දුර්වල යුද උපායන් ගැන මාධ්‍යවලට තොරතුරු කාන්දු වීමෙන් පිලිබිඹු වන්නේ නිලධර කාන්ඩ තුල පවත්නා බලගතු දුක් ගැනවිලි විය යුතු ය. ආන්ඩුවේ පාර්ලිමේන්තු බහුතරය රැඳී ඇත්තේ අස්ථාවර හා කැලිවලට කැඩී ගිය පක්ෂවල සන්ධානයක් මත ය.

මේ තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස, ආන්ඩුවේ එක ම පිලිවෙත වන යුද්ධය පිලිබඳව කෙරෙන කවර විවේචනයක් වුව රාජපක්ෂට ඉවසා සිටිය නොහැකි ය. "යුද ප්‍රයත්නයන් සාර්ථක වීම සඳහා මහජන සහාය අවශ්‍ය ය.... සාවද්‍ය චෝදනා නිර්මානය කිරීම සහ සන්නද්ධ හමුදාවල කාර්ය මාන්ඩලිකයන් වෙත පදනම් විරහිත විවේචන එල්ල කිරීම මගින් මිලිටරියට ලැබෙන මහජන සහාය තුනී කිරීම සඳහා ප්‍රයත්න දරන කවුරු වුව ත්‍රස්තවාදී සංවිධානයට සහාය දෙමින් සිටිති" යි ආරක්ෂක අමාත්‍යාංශ ප්‍රකාශය අනතුරු ඇඟවී ය.

ඉන්ධන සහ ආහාර මිල ගනන් හේතු කොට ගෙන සිදු වන වර්ජන හා උද්ඝෝෂන ද දේශද්‍රෝහී යැයි හංවඩු ගසනු ලැබේ. ජූනි 11 වන දා හා 12 වන දා, ගුරුවරුන් සිය වැටුප් වැඩි කර ගැනීම සඳහා උද්ඝෝෂනයක් දියත් කිරීමට ගිය අවස්ථාවේ, පවතින යුද තත්ත්වය තුල දී උද්ඝෝෂනය සිසුන්ගේ "ආරක්ෂාවට තර්ජනයක්" යැයි කියමින් ආන්ඩුව සියලු රජයේ පාසල් වසා දැමී ය.

මාධ්‍යය විශේෂයෙන් ඉලක්ක කොට ගෙන තිබේ. ආරක්ෂක අමාත්‍යාංශයේ උත්සුකතා අනුව ගත් කල, " ආචාර ධර්ම විරෝධී ක්‍රියා පිලිවෙත්" යන්නෙන් අදහස් කෙරෙන්නේ, හුදෙක් වචනයක් පාසා මිලිටරියේ ප්‍රචාරක ව්‍යාපාරය ම මුද්‍රනය කොට ප්‍රකාශයට පත් නොකරන, ස්වාධීන මූලාශ්‍ර මත පදනම් වන ඕනෑ ම ප්‍රවෘත්ති වාර්තාවකි.

ඒ අනුව, *සන්ඩේ ටයිම්ස්* පුවත්පතේ ආරක්ෂක ලියුම්කරු ඉක්බාල් අතාස් පසු ගිය වසරේ දී රාජපක්ෂගේ ඥාතීන් ද සම්බන්ධ වෙමින් යුක්රේනයෙන් මිග් ජෙට් යානා මිල දී ගැනීමේ දී සිදු වූ ඉහල පෙලේ දූෂන පිලිබඳ චෝදනා වාර්තා කල විට, ඔහුගේ ආරක්ෂාව සඳහා යෙදා තිබූ භට පිරිස වහා ඉවත් කෙරුනු අතර ආන්ඩු හිතවාදී මැරයෝ ඔහුට කායිකව තර්ජනය කලහ. වහා සැඟවී ගත් අතාස් ඔහුගේ නිතිපතා කොලම රචනා කිරීම නවතා දැමී ය.

පසු ගිය මාසයේ, *නේෂන්* පුවත්පතේ සහකාර කර්තෘ කීත් නොයාර් සන්නද්ධ කල්ලියක් විසින් පැහැර ගෙන ගොස් පහර දී, අනතුරුව කොලඹ නගරාසන්නයේ දෙහිවල පිහිටි ඔහුගේ නිවස අසල දී අත් හැර දමා ගොස් තිබුනි. මේ ප්‍රහාරය එල්ල කිරීම සඳහා බලපෑ හේතුව ලෙස පෙනී ගියේ, උසස් වීම් සහ සම්මාන ප්‍රදානය කිරීමේ දී දැක්වූ අනිසි පක්ෂපාතීකම් සම්බන්ධයෙන් හමුදාපතිවරයා විවේචනය කරමින් පල කල ලිපියකි. තමන් පැහැර ගෙන ගියවුන්, මිලිටරිය තුල සිටිමින් තමන්ට තොරතුරු සපයන මූලාශ්‍ර කවරේදැයි හඳුනා ගැනීම සඳහා තමන්ගෙන් ප්‍රශ්න කල බව නොයාර් පැවසී ය.

නොයාර් වත් අතාස් වත් යුද්ධයේ විරුද්ධවාදියෙක් නො වේ.

හට ගන්නා සිදුවීම් සංඛ්‍යාව අඛන්ඩව ඉහල නගිමින් තිබේ:

* මැයි 27 වන දා, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය (එස්එල්පීඅයි) වෙත ගිය මිලිටරි ඇඳුම්වලින් සැරසී ගත් සන්නද්ධ පිරිසක් අධ්‍යක්ෂවරුන් ඇතුලු සියලු සේවකයන්ගේ නම් ඉල්ලා සිටියහ. ඔවුන්ගේ අනන්‍යතාව පිලිබඳව විමසා සිටි විට එක් කෝපරල්වරයෙක් කියා සිටියේ තමන් මිලිටරි රහස් ඔත්තු සේවයේ නිලධරයෙකු බව යි.

* මැයි 27 වන දා මාධ්‍යවේදීන් විසින් සිදු කරන ලද උද්ඝෝෂනයකින් අනතුරුව, ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමයේ (එස්එල්ඩබ්ලිව්ජේඒ) නායකයන් දෙදෙනෙකු වන සනත් බාලසූරිය හා පෝද්දල ජයන්ත කැඳවූ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, මිලිටරිය විවේචනය නො කරන ලෙස ඔවුන්ට අනතුරු ඇඟවී ය. හමුදාවේ "ගරු කටයුතු" ආඥාපතිවරයා අවඥාවට ලක් කරන කවුරුන්ට වුව ද හානි පැමිනෙනු ඇතැයි ඔහු ඇඟවී ය.

* මැයි 28 වන දා, උතුරේ යාපන අර්ධද්වීපයේ පිහිටි ආන්ඩුවේ පාලනය යටතේ පවතින නවන්තුරෙයි නගරයේ දී, සිරස, ශක්ති හා එම්ටීවී රූපවාහිනී ජාලයේ යාපන දිස්ත්‍රික්ක වාර්තාකරුව සිටි පී. දේවකුමාර් කපා කොටා මරා දමනු ලැබිනි.

* මැයි 29 වන දා, දිනපතා දිවයින සිංහල පුවත්පතේ ආරක්ෂක වාර්තාකරු වන සිරිමෙවන් කස්තුරිආරච්චිට කායිකව තර්ජනය කල මැර කන්ඩායමක්, යුද්ධය හා මිලිටරිය ගැන තව දුරටත් නො ලියන ලෙස අනතුරු ඇඟවී ය. මැර කල්ලිය ඔහුගේ නිවසට කඩා වැදුනේ පාන්දර 4ට පමන ය.

* මොන්ටේජ් මාසික සඟරාවේ කර්තෘවරිය මෙන් ම මිලිටරිමය කාරනා ගැන ද ඇතුලුව නේෂන් පුවත්පතට ලිපි සම්පාදනය කරන්නියක ද වන ෆ්‍රෙඩ්රිකා ජැන්ස්ට යලි යලිත් තර්ජනය කොට තිබේ. ජූනි 15 වන දා තරම් මෑතක දීත්, තමන්ගේ "අනවශ්‍ය වැඩ කටයුතු" තව දුරටත් කර ගෙන යාමෙන් වලකින ලෙස ඇයට අනතුරු අඟවනු ලැබිනි.

* ජූනි 17 වන දා, ආරක්ෂක ලේකම්වරයා විවේචනයට ලක් කරමින් පෙබරවාරි 21 වන දා පල කෙරී තිබූ ප්‍රවෘත්ති වාර්තාවක් සම්බන්ධයෙන් අනතුරු අඟවනු වස් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව (සීඅයිඩීය) *ලංකා-ඊ-නිව්ස්* වෙබ් අඩවියේ ප්‍රධාන සංස්කාරකවරයා කැඳවී ය.

* ජූනි 30 වන දා, කලින් ටීඑන්එල් රූපවාහිනී සේවයේ ප්‍රවෘත්ති සංස්කාරකවරයා වූ සහ දැන් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ සේවකයෙකු වන නාමල් පෙරේරාටත් ඔහුගේ මිතුරෙකු වූ කොලඹ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ මාධ්‍ය නිලධාරියෙකු වන මහේන්ද්‍ර රත්නවීරටත් මැරයෝ පහර දුන්හ. මැරයන් ඔවුන් නවතා පහර දුන් අවස්ථාවේ පෙරේරා සහ රත්නවීර නාරාහේන්පිටත් කිරුලපනත් අතර රියකින් ගමන් ගනිමින් සිටියහ. සිද්ධියෙන් පසු දෙදෙනා ම රෝහල්ගත කරන ලදහ.

පැන නැගෙමින් පවතින්නේ අංග සම්පූර්න පොලිස් රාජ්‍යයකි. රාජපක්ෂ ආන්ඩුව, ආරක්ෂක හමුදාවල සහ රාජ්‍ය නිලධරයේ ඉහල ස්ථර සමග සන්ධානගතව, තමන්ගේ සාපරාධී යුද්ධය කර ගෙන යාමේ නාමයෙන්, මොන යම් විරුද්ධත්වයක් වුව දේශද්‍රෝහී යැයි සලකන අතර, ඒවා වනසා දැමීම සඳහා අධිකරනයෙන් පිටස්තර වූ විධි ක්‍රම මත වැඩි වැඩියෙන් පදනම් වෙමින් සිටියි.

© www.wsws.org